# ශිලාලේඛන මඟින් හෙළිවන ලක්දිව පුරාණ වෙදකම පිළිබඳ අධ්‍යයනයක්

**දසනායක ඩී.එම්.පී.අයි.**[1]

නීරෝගීභාවය යනු මානවයාට තම ජීවනාලිය යහපත් අයුරින් පවත්වා ගැනීමට උපකාරී වන්නක් නමුදු සෑම පුද්ගලයෙකුටම විවිධකාර රෝගාබාධ වැළඳීම සාමාන්‍ය කරුණකි. මෙලෙස මිනිසාට ඇතිවන්නා වූ විවිධ රෝගාබාධයන් වළක්වා ගැනීම සඳහා මනා පිටුබලයක් පුරාණ වෙදකම තුළින් හිමි වන අතර, වර්තමානයේදී මෙන්ම පුරාතනයේ ද ඒ සඳහා විවිධ වූ වෛද්‍ය ක්‍රමෝපායන් භාවිත කර තිබේ. මෙලෙස භාවිත කරන ලද විවිධ ක්‍රමවේදයන් පිළිබඳ තොරතුරු අන්තර්ගතවන වැදගත් පුරාවිද්‍යා මූලාශ්‍රය විශේෂයක් ලෙස ශිලාලේඛන හඳුන්වාදිය හැකිය. එලෙස හමුවන ශිලාලේඛන කිහිපයක් අධ්‍යයන පරාසය ලෙස යොදාගෙන සිදුකරන ලද මෙම අධ්‍යයනයේ අධ්‍යයන අරමුණ වන්නේ අස්පර්ශීය උරුමයක් ලෙස ද සඳහන් කළහැකි අතීත වෛද්‍ය ශාස්ත්‍රය හඳුනාගෙන ඒවා මතු පරපුර වෙනුවෙන් රැකගැනීමය. මෙම අධ්‍යයනය සිදුකිරීමේදී අධ්‍යයන ක්‍රමවේදය ලෙස ප්‍රාථමික හා ද්විතියික මූලාශ්‍රය වැදගත් විය. අධ්‍යයනයෙන් හෙළි වූ කරුණු අනුව පාලියෙහි "වෙජ්ජ" ලෙස ද සංස්කෘතෙහි "වෛද්‍ය" ලෙස ද සඳහන් වන වෛද්‍ය වෘත්තිකයන් ගැන සහ පුරාණ වෛද්‍ය ශාස්ත්‍රය පිළිබඳ තොරතුරු සිව්වැනි මිහිඳු රජුගේ මිහින්තලා සෙල්ලිපිය, රාජාංගනය ලිපිය, පස්වැනි කාශ්‍යප රජුගේ පුවරු ලිපිය, දොරබාවිල ටැම් ලිපිය, කිරිබත්වෙහෙර ටැම් ලිපිය යනාදී ලේඛනවල සඳහන් වේ. මෙකල පැවති වෛද්‍ය ක්‍රමයන් පිළිබඳව සහ රජවරු වෙදකමට දැක්වූ අනුග්‍රහයන් පිළිබඳ තොරතුරු සෙල්ලිපිවල සඳහන් කර තිබේ. මෙයින් කිරිබත්වෙහෙර ටැම් ලිපියේ සිව්වැනි කාශ්‍යප රජු තුම්බර තූපාරාම නැමැති බෙහෙත් ශාලාවකට ඉඩම් පරිත්‍යාග කළ බව ද, සිව්වැනි මිහිඳු රජුගේ මැදිරිගිරිය පුවරු ලිපියේ මැදිරිගිරිය ආරාම සංකීර්ණයේ පිහිටි ආරෝග්‍ය ශාලාවක නීතිරීති පිළිබඳව ද තොරතුරු සඳහන්ය. ඊට අමතරව අභයගිරිය රත්න ප්‍රාසාදයට නුදුරින් හමු වූ පස්වැනි කාශ්‍යප රජුගේ සෙල්ලිපියක නුවර මංගල මහා වීදියේ දකුණු දොරටුව ආසන්නයේ වෛද්‍ය ශාලාවක් කරවා රෝග බිය සමනය කළ බව සහ දොරබාවිල ටැම් ලිපියේ සිව් වැනි දප්පුල රජු විසින් ප්‍රධාන වෛද්‍යවරයෙකු වෙත ගම්වරයක් ප්‍රධානය කිරීම පිළිබඳව ද තොරතුරු සඳහන්ය. තවද සිව්වැනි මිහිඳු රජුගේ අභයගිරි ශිලාලේඛනයේ එම රජතුමා විසින් රෝහලක් ඉදිකළ බව සහ පොළොන්නරු රාජසභා මණ්ඩප ශිලාලේඛනයෙහි එක් ඉඩම් හිමියෙකු විසින් වාර්ෂිකව රෝහලකට වියළි ඉඟුරු පැළයක් ලබාදිය යුතු වූ අතර එසේ සිදුනොකළහොත් එය රනින් ගෙවිය යුතු බවට තොරතුරු දැක්වේ. හතරවැනි මිහිඳු රජතුමාගේ මිහින්තලා පුවරු ලිපිවල පැරණි වෙදකම් හා වෙදහල් පිළිබඳව දැක් වේ. ඒ අනුව මෙම අධ්‍යයනයෙන් පැහැදිලි වන්නේ ශිලාලේඛන මඟින් මෙරට පුරාණ වෙදකම පිළිබඳව තොරතුරු රැසක් අනාවරණය වන බවය.

**මුඛ්‍ය පද** : නීතිරීති, පරිත්‍යාග, පුරාණ, වෙදකම, ශිලාලේඛන

[1] මානවශාස්ත්‍ර අධ්‍යයනාංශය, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය. ishanipoornima80@gmail.com